# කඳ පණු සංහාරය

මා පුදුමයට හා විස්මයට පත් කරන පාර්සලයක් මගේ මිතුරකුගෙන් ලැබුණේ මාසයකට කලින්ය. වෙනත් ප්‍රාන්තයක වාසය කරන ඔහු මගේ සිංගරු සිරිත කියවූවෙකි. මම ඔහුට පිටපතක් තෑගි කළෙමි. පාර්සලය එවන්නට හේතු වුයේ එය කියවීමෙන් ලද ආශ්වාදය විය යුතුය. එහි අඩංගු වූයේ ගම රට බලා ගිය විට ලැබුණ පොතක් හා ලිපි ගොන්නකි.



පොත බෙංගමුවේ නාලක හිමියන් ලියූවකි. මට මතක හැටියට එහි නම "බුදු සසුන වනසන කඳ පණුවෝ" යන්නය. දැන් මා ළඟ' පිටපත නැත. මා නොකියවූයේ කඳ පණුවන් ගැන මා දන්නා හරිය සෑහෙන නිසාය. මට විනෝද වීමට දන්නා ටික ප්‍රමාණවත් නිසාය.

අර පොතෙන් පිටපත් දෙකක්ම ආවේය. ඡායා පිටපත් එකක් සමග අර ඉංගිරිසි ලිපි මෙහි සිටින ජාතික ප්‍රේමියකුට දෙනු පිණිසය. මම ඒ ටික ඔහුට ලැබෙන්නට සැලැස්වීමි.

මා ඒ ටික තව කෙනකු අතට දුන්නේ අසවලාට යවන්න හැබැයි මං දීපු විත්තිය කියන්න එපා යන අනතුරු ඇඟවීම ද සමගය. එයට හේතුව පැහැදිලි කිරීමට මට සිදු විය. මේ කියන දේශ (ජාති) ප්‍රේමියා ගේ මතයට මා ගරු නොකරන නිසා ඔහු මා සලකන්නේ සතුරකු හැටියටය. මා දුන් බව දැනගත්විට ඔහු ගේ ලේ නරක් වන්නට ඉඩ ඇත . මං මොන එහෙකටද එහෙම හානියක් ඔහුට කරන්නේ?

මගේ මිතුරාට ඒ ගමන්ම කෙටි ලිපියක් යැවීමි. එවූ පොත් හා ලිපි ලැබුණා. ස්තුතියි. ශ්‍රී ලංකාව බේරා ගන්නට අහවලා (නම) තවම ඉන්නවා. බුදු සසුන බේරා ගන්නට මහා සංඝ රත්නය ඉන්නවා. මම ඔය නොන්ත්‍රාත් බාරගන්නේ නැහැ.

මම තවත් කරුණක් අවධාරණය කළෙමි. ඔබේ මෙහේ ඉන්නා මිතුරාට පොත යැවූ බව ඔහු අත එවූ බවත් කියන්න එපා.

මේ ලියන මොහොත වන විට මගේ ලිපිය යවා සති දෙකක් පමණ ගතවී ඇත . මා බලා සිටින්නේ අල්ලපු උප නගරයේ සිටින මගේ මිතුරා මට කතා කරන තෙක්ය. කතන්දරය ඔහුට කියන්නටය. ඔහු මේ චරිත සියල්ලම හොඳින් දන්නෙකි. චරිත අවබෝධ කරගන්නෙකි.

බෙංගමුවේ නාලක හාමුදුරුවෝ මෙල්බන් නුවරට ආපු වෙලාවක පැවැත්වූ ප්‍රසිද්ධ දේශනයක් ඇසීමට මම ගියෙමි. ඒ 2003 දී පමණය. මැතිවරණයකට ආසන්න අවදියකය. උන්වහන්සේ බර තබා කියපු දෙයක් මට හොඳට මතකය.

"අපි හැම පන්සලකින්ම ගම් මට්ටමෙන් දියත් කිරීමට හොඳ වැඩ පිළිවෙලක් සකස් කරලා තියෙන්නේ"

මොකක්ද දෙවියනේ මේ අගේ ඇති වැඩපිළිවෙල . ? මට නම් අද වන තෙක් ඒ ගැන හාංකාවිසියක් දැන ගන්නට ලැබී නැත . ඒ කතාව අසාගෙන සිටි සැදැහැවත් බෞද්ධයන්ට මතක නැතුවත් ඇති. අසා ගෙන හිටියා පමණක් නොව වැඳලා පරිත්‍යාග කළ දෙයට? මා එක්කන් ගිය පින්වතාද මල්ලට ඩොලර් පහක් රිංගවනවා මං බලාගෙනය. ඒ සියල්ලම පිනට ය. මට පින් කර ගන්නට බැරි වුණාය. වරද මගේම ය.

පිනිට ලැබිච්ච පොතවත් නොකියවා නෙවද මේ ලියන්නේ යයි මට චෝදනා කරන්නට සිටින අයද සිටිය හැකිය. මා ඒ පොත නොකියවූ

## කස්තිරම

ඩී බී කුරුප්පු

හේතුව පැහැදිලි කළ යුතුය. එකක් මා දැනට ම වන්න කඳ පණුවන් ගැන මටත් පොතක් ලියන්නට පුලුවන. මගේ ලිපි එකතුවක ටිකක් ලියා ඇත . ඉදිරියට එන ලිපි එකතුවක තව ටිකක් ඇත . මා ලියන ලිපි වලට තවත් කරුණු ඇතුළත්ව ඇත . මගේ සිතේද තව ටිකක් ඇත . මා මෙය අමුතු සෙල්ලමක් බවට පත් කර ගන්නවා නොවෙයි.

අද දවසේ ශ්‍රී ලංකාවේ ප්‍රාදූර්භූතව ඇති බලවේග - බොදු බල සේනාව සමග රාවණා බලවේගය වාගේ - නිසා අර නාලක හිමියන් කියාපු සංවිධානාත්මක වැඩ සටහනේම කොටස්ද යන ප්‍රශ්නයක් මගේ සිතට එයි. ඒ හාමුදුරුවන් දකින කඳ පණුවන් ඒ සංවිධාන තුළ ද ජීවත් වන්නට ඉඩ ඇත . මට නොවරදවාම අර කියපු සංවිධානය එබඳු බලවේග නිසා ඒ වගේ පණු සංහාරයටද නැතහොත් කඳ පණුවන්ට ද යන ප්‍රශ්නය ඒ සමගම මතුවෙයි.

අනගාරික ධර්මපාල හික්කඩුවේ ශ්‍රී සුමංගල පියදාස සිරිසේන වැනි ගිහි පැවිදි සමාජ සේවකයන් විසින් ඉටු කරන ලද මෙහෙවර අද මතක් කරන්නේ අනුස්මරණ උත්සවයකදී පමණී. ඒ කාලයේ හිටපු කඳ පණුවන් අද තරම් බලසම්පන්න නොවූ බවක්ද පෙනෙයි. මේ තරම් විවිධ ස්වරූපයෙන් ජනිත වූ සත්ව විශේෂද විරළවිය.

කඳ පණුවා වනාහි පිටතට නොපෙනීම විනාශය කරන්නට සමත් සත්ව විශේෂයකි. මුළු කඳම මැරී යන තෙක් රෝගය හොඳ නොවන්නටද ඉඩ ඇත . ඔවුන් කරන විනාශය සුළු පටු නොවේ. බොදු සසුන තුළ පවා විවිධ පණු වර්ග එහෙම සිටිනවා නම් මුළු ගෙය තුළම අහු මුළු සුද්ද පවිත්‍ර කොට තවත් සැක සහිත ප්‍රාණීන් ඇති බවට සැක ඇතොත් ඉස්සර අප කරන විදියට හොඳවායින් කට්ටඩියකු ලවා දුම්මල ගස්සවන්නට සිදු වනු ඇත . ඊටත් වඩා බරපතල නම් සන්නි නැටුමක් කළ යුතු වන්නේය. සමහර සත්තු දුම්මල ගැසුවත් පිටව නොයන්නෝය. යන එවුන් නම් කොරහ බිඳ ගෙන හරි යන එක සිතුරුය.

අපි බලා සිටිමු. මට ඒ උදවියගෙන් හානියක් සිදු නොවන බවත් මම දනිමි. එක අතකින් ඔය යක්කුන්ට මේ රටට යන්නට වීසා නොදෙන බව මට සහතිකය. කල්තෝනි ක්‍රමයට ආවත් අල්ලලා පිට මං කරන එකත් සිකුරුය. ඉතින් මා අල්ලා ගන්නට වුවමනා නම් ශ්‍රී ලංකාවට යන වෙලාවක එහෙම තරන්නට සිදුවන්නේය.

කට්ටඩියාගේ මන්තරයට කලින් කරන වගන්තියක් මට මතක් වෙයි.

"මළවුන් බලා යව"

එහෙව් එකේ මගේ මිතුරාට කොච්චර උනන්දුවක් ඇතත් මං වාගේ නරුමයන් ඔය පණු වර්ගය පස්සේ පන්නන්නේ මොන එහෙකටද?


αlpha academy
Primary, Secondary ,VCE
2014 Program - Enrollments open
Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts, Analytical Writing
Classes conducted by Current School Teachers
Contact - Sarah on 0457908918
ABN 52267352093

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements
We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES
WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.
FOR APPOINTMENTS
9890 3609
DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS
DR. ENOKA JAYATILAKEBANDA (BDS)
MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)
www.montalbertdentists.com.au